# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1876/40 - 2014 අගෝස්තු මස 22 වැනි සිකුරාදා - 2014.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරණ ලද ප්‍රකාශන ආදිය

ජනා.කා. අංකය : සීඑස්ජ්/7/8/15.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති**
**අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසිනි**

(මුද්‍රාව)

මහින්ද රාජපක්ෂ

1. මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මැතිතුමා
2. දිමින්ගු බඩතුරුගේ ප්‍රියන්ති සුරංජනා විද්‍යාරත්න මැතිනිය
3. මනෝ රාමනාදන් මැතිනිය

වෙත,

ශුභාසිංශන පෙරටුවයි !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වැනි අධිකාරය වූ) 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර වර්ෂ 2013 ක්වූ අගෝස්තු මස 12 වැනි දිනැති අධිකාරී පත්‍රය මගින් පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවා ඇති හෙයින්ද,

තවද, 2014 මාර්තු මස 21 දිනැති සහ 2014 ජූලි මස 14 දිනැති අධිකාරී පත්‍ර මගින් එම මුල් අධිකාරී පත්‍රයට සංශෝධන හා එකතුකිරීම් කරනු ලැබ ඇති හෙයින්ද,

තවද, ඉහත කී 2014 ජූලි මස 14 දිනැති අධිකාරී පත්‍රය මගින් කොමිෂන් සභාවේ උපදේශක සභාවක සේවය කිරීම සඳහා ජාත්‍යන්තර විශේෂඥයින් තිදෙනෙකු මවිසින් පත් කරනු ලැබ, තවදුරටත් අවශ්‍ය වන පරිදි විශේෂඥයින් පත් කරනු ලබන බව එකී අධිකාරී පත්‍රයෙහි සඳහන් කරනු ලැබ ඇති හෙයින්ද,

ඒ අනුව තවත් විශේෂඥවරු පත් කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇති හෙයින් ද,

එකී උපදේශක සභාවේ සේවය කිරීම සඳහා පහත සඳහන් ජාත්‍යන්තර විශේෂඥයින් මම මෙයින් පත් කරමි.

1. අව්ධාශ් කෞෂාල් මැතිතුමා
2. අහමර් බිලාල් සූෆි මැතිතුමා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහහතරක් වූ අගෝස්තු මස 19 වැනි දින වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

09 - 200


1A - G 20104 — 05 (2014/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*